# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2019 (පැරණි නිර්දේශය)

## 52 - නර්තනය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

කාලය පැය 02යි.
වරණ 5න් යුත් බහුවරණ ප්‍රශ්න 25ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 25කි.
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ප්‍රශ්න 50 කි. (50 ×2) මුළු ලකුණු 100කි.

52 නර්තනය(දේශිය) - 11 පත්‍රය.

කාලය පැය 03යි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් හතරකින් සමන්විතය.

| | | |
|---|---|---|
| 1 කොටස | - | ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 03කි. |
| | | ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. |
| | | එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි. |
| 11 කොටස | - | ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 02කි. |
| | | එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. |
| | | එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි. |
| 111 කොටස | - | ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 02කි. |
| | | එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. |
| | | එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි. |
| 1v කොටස | - | ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 02කි. |
| | | එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. |
| | | එක් ප්‍රශ්නයකට ලකුණු 20 කි. |

| | |
|---|---|
| පළමු පත්‍රය ( ප්‍රශ්න 50×2) ලකුණු | 100 |
| දෙවන පත්‍රය සඳහා (20×5) ලකුණු | 100 |
| 1 සහ11 පත්‍ර සඳහා 100+100 ලකුණු | 200 |
| | 2 |
| අවසාන ලකුණු | 100 |

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..........................................................
..........................................................
.......................................................... √ △ $\frac{4}{5}$

(ii) ..........................................................
..........................................................
.......................................................... √ △ $\frac{3}{5}$

(iii) ..........................................................
..........................................................
.......................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

**අභිමතාර්ථ.**

**නර්තන විෂය නිර්දේශයට අදාළ /ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ/ න්‍යායාත්මක හා ප්‍රායෝගික විෂය අන්තර්ගතයේ නිපුණතා සාක්ෂාත් කර ගැනීම.**

- නර්තන කලාවේ විකාශනය පිළිබඳ ඓතිහාසික දැනුම මැන බැලීම.
- දේශීය නර්තන කලාව හා බැඳි සංස්කෘතික පසුබිම පිළිබඳ දැනුම මැන බැලීම.
- ජන නැටුම් පිළිබඳ අවබෝධය ලබා ගැනීම.
- ප්‍රස්තාරකරණය පිළිබඳ දැනුම,අවබෝධය භාවිතය හා හැකියාව ඇගයීමට ලක් කිරීම
- විෂය ක්ෂේත්‍රයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල දැනුම,අවබෝධය හා භාවිතය විචාරය කිරීමේ හැකියාව ලබා ගැනීම.
- නිර්මාණාත්මක චින්තනය හා කුසලතා හඳුනා ගෙන සංස්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව ලබා ගැනීම.
- සන්නිවේදන මාධ්‍ය පිළිබඳ හඳුනා ගෙන ඒවායෙහි ගුණාත්මක බව රස වින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම පිළිබඳ හැකියාව ලබා ගැනීම.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නර්තනය - (දේශීය) I
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

52 S I

2019.08.07/ 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ........................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 13 | |
| 03 | 14 - 23 | |
| 04 | 24 - 35 | |
| 05 | 36 - 42 | |
| 06 | 43 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**

※ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
※ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

● අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** 'මංගලම්' නර්තනයට අදාළ මූලික බෙරපදය වන්නේ,
(1) ගත් දිත් තත් දොම් තකු දොම්
(2) දොං තකු දං ගජිංත
(3) දොං තකු දොං ජිං තක තරිකිට
(4) කුං දිත් තත් දොං තක තරිකිට
(5) දොංතකු දොංතකු දොංජිං ගත් තත් ජිං තරිකිට (.........)

**2.** කෝලාට්ටම්, සුලකු සහ චෙම්බු යන ද්‍රවිඩ ගැමි නැටුම්වලට සමාන සිංහල ගැමි නැටුම් ලෙස සැලකෙන්නේ,
(1) ලී කෙළි, කුලු සහ කළගෙඩි නැටුම් ය.
(2) ලී කෙළි, කුලු සහ සවරම් නැටුම් ය.
(3) කුලු , කළගෙඩි සහ මෝල්ගස් නැටුම් ය.
(4) කුලු , සවරම් සහ පතුරු නැටුම් ය.
(5) ගොයම් කැපීම, සවරම් සහ තාලම් නැටුම් ය. (.........)

**3.** "දොංත ගතම් දොංත ගතිගතම්...." යන පදයෙන් සභාවට පිවිසෙන කෝලම් චරිතය වන්නේ,
(1) මුදලි ය. (2) අණ බෙරකරු ය. (3) ජසයා ය.
(4) ලෙන්චිනා ය. (5) නොංචි ය. (.........)

**4.** "ඕඩි හෙලේ හෙල වටකර මුළුල්ලා - ගල්නළලත බැන්දා වැනි තොටිල්ලා"
මෙම කවිය අයත් ගායනා විශේෂය කුමක් ද?
(1) ගොයම් කවි (2) බඹර කවි (3) ධීවර කවි (4) පතල් කවි (5) රබන් කවි
(.........)

**5.** කරුණ, භයානක සහ බීභත්ස්‍ය යන රසයන්ගෙන් නිෂ්පන්න වන භාවයන් වන්නේ,
(1) භය, ශෝක සහ උත්සහයයි. (2) භය, ශෝක සහ විශ්මයයි.
(3) ශෝක, භය සහ ජුගුප්සාවයි. (4) ශෝක, භය සහ හාස්‍යයයි.
(5) ශෝක, භය සහ රතියයි. (.........)

**6.** අනුරාධපුර කුට්ටම් පොකුණ අසලින් ලැබුණු ලෝකඩ රූපයෙන් පිළිබිඹු වන්නේ,
(1) නිළියන් සහ නළුවන්ගේ රූප පෙළකි.
(2) බෙර වාදකයකුගේ රූපයකි.
(3) භ්‍රමණය වන නළඟනකගේ නර්තන විලාසයකි.
(4) වීණා වාදකයින් සහ තාලම්පට වයන රූපයකි.
(5) නටන ස්ත්‍රියක සහ පුරුෂයකුගේ විලාසයකි. (.........)

**7.** වාහල හා පත්තිනි නර්තනය දැකිය හැකි වන්නේ,
(1) පහතරට දෙවොල්මඩුවේ දී ය. (2) උඩරට ගම්මඩුවේ දී ය.
(3) සබරගමු පහන්මඩුවේ දී ය. (4) පහතරට පහන්මඩුවේ දී ය.
(5) සබරගමු දෙවොල්මඩුවේ දී ය. (.........)

**8.** උඩරට, පහතරට සහ සබරගමු ශාන්තිකර්මවලට අයත් නාට්‍යමය පෙළපාළි අවස්ථා පිළිවෙළින්,
(1) ඌරා යක්කම, නානුමුරය සහ පොත්කඩේ යක්කම වේ.
(2) ඌරා යක්කම, කෝල්මුරය සහ අසුර යක්කම වේ.
(3) නයා යක්කම, පොත්කඩේ යක්කම සහ දර්ශන යක්කම වේ.
(4) ආවැන්දුම, නානුමුරය, දළුමුර පාළිය වේ.
(5) ගුරුගේමාලාව, නානුමුරය සහ දේවකෝල්පාඩුව වේ. (.........)

**9.** වෙස් ඇඳුම් කට්ටලයේ කොටස් ඇතුළත් වරණය තෝරන්න.
(1) උරමාල පටිය, බුබුලු පටිය, හස්තකඩය (2) උරමාල පටිය, බුබුලු පටිය, සිලුමිණ
(3) සිඛා බන්ධනය, අවුල් හැරය, සේලය (4) සිඛා බන්ධනය, අවුල් හැරය, උල්උඩය
(5) අවුල් හැරය, උරමාලය, උල්උඩය (.........)

**10.** පොත්කඩේ පාළිය හා වඩිග පටුන යන පෙළපාළි අංග දැකිය හැකි වන්නේ,
(1) පහන් මඩුවේ හා සූනියම් යාගයේ දී ය. (2) පහන් මඩුවේ හා රටයකුමේ දී ය.
(3) දෙවොල් මඩුවේ හා රටයකුමේ දී ය. (4) දෙවොල් මඩුවේ හා ගරායකුමේ දී ය.
(5) දෙවොල් මඩුවේ හා වලියකුමේ දී ය. (.........)

**11.** අඩ ඉර, බොකු හම් සහ ගැටිය යොදාගනු ලබන්නේ පිළිවෙළින්,
(1) ගැට බෙරය, පහතරට බෙරය සහ බුම්මැඩිය සඳහා ය.
(2) ගැට බෙරය, පහතරට බෙරය සහ දවුල සඳහා ය.
(3) ගැට බෙරය, රබාන සහ දවුල සඳහා ය.
(4) උඩැක්කිය, තම්මැට්ටම සහ දවුල සඳහා ය.
(5) උඩැක්කිය, රබාන සහ තම්මැට්ටම සඳහා ය. (.........)

**12.** "රූ රැසේ අඳිනා ලෙසේ අත් ළෙල දිදී විදුලිය පබා ....." යන කවිය සඳහන් වන්නේ,
(1) ගම්පළ යුගයට අයත් තිසර සංදේශයේ ය.
(2) ගම්පළ යුගයට අයත් මයුර සංදේශයේ ය.
(3) කෝට්ටේ යුගයට අයත් සැළලිහිණි සංදේශයේ ය.
(4) කෝට්ටේ යුගයට අයත් ගුත්තිල කාව්‍යයේ ය.
(5) කෝට්ටේ යුගයට අයත් පරෙවි සංදේශයේ ය. (.........)

**13.** පාසල් අධ්‍යාපනයේ නර්තන විෂය සම්බන්ධ ව පත් වූ ප්‍රථම අධ්‍යක්ෂවරයා වන්නේ,
(1) ඇස්. පණිභාරත ය. (2) ඩබ්ලිව්. බී. මකුලොලුව ය.
(3) එස්. එල්. බී. කපුකොටුවේ ය. (4) ජේ. ඊ. සේදරමන් ය.
(5) ශ්‍රී ජයනා රාජපක්ෂ ය. (.........)

**14.** ‘උනුනුපියන’ යනුවෙන් හඳුන්වන්නේ,
(1) කපුයක්කාරියෙහි භාවිත කපුයන්තරයයි. (2) කපුයක්කාරියෙහි භාවිත නානුමුර වට්ටියයි.
(3) සන්නියකුමේ භාවිත පිදවිලි වට්ටියයි. (4) නානුමුරයේ දී භාවිත වට්ටියෙහි පියනයි.
(5) නානුමුරයෙහි භාවිත නානුමුර වට්ටියයි. (.........)

**15.** ‘සිරිවසගෙන අසු නැගෙමින් නොලෙසා ....’ මෙම කවියෙන් කියැවෙන්නේ කුමන ග්‍රහයා පිළිබඳ ව ද?
(1) කුජ ග්‍රහයා (2) රවි ග්‍රහයා (3) සිකුරු ග්‍රහයා
(4) බුද ග්‍රහයා (5) ශනි ග්‍රහයා (.........)

**16.** කෝලම් නාටකයේ එන ජස කෝලම හා සම්බන්ධ වන අනෙකුත් චරිත වන්නේ,
(1) ලෙන්චිනා, පුරන්සිනා සහ මුදලි ය. (2) ලෙන්චිනා, නොංචි සහ මුදලි ය.
(3) ලෙන්චිනා, අණබෙර සහ චුක්කිනියා ය. (4) පුරන්සිනා, අණබෙර සහ ඩුංගුරුවා ය.
(5) අණබෙර, හෙන්චප්පු සහ හේවාරාළ ය. (.........)

**17.** අත්‍යා බෙර යනු,
(1) සමූහ බෙර වාදන අවස්ථාවකි.
(2) ශිල්පීන් දෙදෙනකු අතර දක්ෂතා පෙන්වන ශාස්ත්‍රීය බෙර වාදන අවස්ථාවකි.
(3) සමූහ ශාස්ත්‍රීය මංගල බෙර වාදන අවස්ථාවකි.
(4) යුගල වශයෙන් අලංකාර බෙර පද වාදන අවස්ථාවකි.
(5) පිරිත් ආරම්භයේ දී කරනු ලබන බෙර වාදන අවස්ථාවකි. (.........)

**18.** දුනුමාලප්පුව සහ කෝල්පාඩුව යනු,
(1) පහන් මඩුවේ ඒකල නර්තන වේ. (2) පහන් මඩුවේ සමූහ නර්තන වේ.
(3) දෙවොල් මඩුවේ සමූහ නර්තන වේ. (4) කොහොඹා යක් කංකාරියේ ඒකල නර්තන වේ.
(5) කොහොඹා යක් කංකාරියේ සමූහ නර්තන වේ. (.........)

**19.** භරත නාට්‍යම් සංදර්ශනයක, නර්තනාංග පෙළෙහි නෘත හා නෘත්‍ය ගණයට ගැනෙන්නේ,
(1) වර්ණම් හා ශබ්දම් ය. (2) ශබ්දම් හා තිල්ලානා ය.
(3) ජතිස්වරම් හා අලාරිප්පු ය. (4) ජතිස්වරම් හා වර්ණම් ය.
(5) පදම් හා තිල්ලානා ය. (.........)

**20.** සාම්ප්‍රදායික බලි රූපයක් වර්ණ ගැන්වීම සඳහා යොදාගනු ලබන්නේ,
(1) ගස්වල පොතු, කිරි මැටි සහ තේ කොළ ය.
(2) ගස්වල පොතු, බුලත් විට සහ දැලි ය.
(3) ශාක පත්‍ර යුෂ, ගඩොල් කුඩු සහ පැන්කේක් ය.
(4) ශාක පත්‍ර යුෂ, දැලි සහ පවුඩර් ය.
(5) ශාක පත්‍ර යුෂ, දැලි සහ අඹරාගත් කහ ය. (.........)

**21.** කථක් නර්තනය සඳහා භාවිත වාද්‍ය භාණ්ඩ වන්නේ,
(1) පඛාවජ්, මද්දල සහ හාර්මෝනියම් වේ.
(2) පඛාවජ්, තබ්ලාව සහ හාර්මෝනියම් වේ.
(3) වෙන්ඩාව, මෘදංගම් සහ කෝල් බෙරය වේ.
(4) වෙන්ඩාව, පඛාවජ් සහ වීණාව වේ.
(5) වෙන්ඩාව, තබ්ලාව සහ වයලීනය වේ. (.........)

**22.** නර්තන කලාවේ ආහාර්ය අභිනය ලෙස සැලකෙන්නේ,
(1) වේදිකා සැරසිලි, ආලෝකය සහ රංගවස්ත්‍රාභරණ ය.
(2) වේදිකා සැරසිලි, සංගීතය සහ වාදන උපකරණ ය.
(3) වේදිකා සැරසිලි, ආලෝකය සහ නළු නිළියන් ය.
(4) වේදිකා සැරසිලි, රංග වින්‍යාසය සහ රංගවස්ත්‍රාභරණ ය.
(5) රංග වස්ත්‍රාභරණ, ආලෝකය සහ රංග වින්‍යාසය ය. (.........)

**23.** රංග වින්‍යාසයේ මූලික සංකල්පයක් වන චලනයෙහි ස්වභාවය වෙනස් වීම කෙරෙහි බලපාන සාධක වන්නේ,
(1) කාලය, වේගය, දුර සහ අවකාශය වේ.
(2) තාලය, අංග, ප්‍රත්‍යාංග සහ උපාංග වේ.
(3) ශක්තිය, කාලය, හැඩතල සහ ප්‍රත්‍යාංග වේ.
(4) ශක්තිය, කාලය, වේගය සහ දුර වේ.
(5) ශක්තිය, කාලය, වේගය සහ හැඩතල වේ. (.........)

**24.** මන්තිරි වන්නම, හංස වන්නම සහ නළඟන වන්නම යන නවතම වන්නම් නිර්මාණය කර ඇත්තේ පිළිවෙළින්,
(1) මුදියන්සේ දිසානායක, ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ආරියරත්න කළුආරච්චි ය.
(2) මුදියන්සේ දිසානායක, ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ජයසේන කෝට්ටගොඩ ය.
(3) ආරියරත්න කළුආරච්චි, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ ප්‍රේමකුමාර එපිටවෙල ය.
(4) ආරියරත්න කළුආරච්චි, ප්‍රේමකුමාර එපිටවෙල සහ මුදියන්සේ දිසානායක ය.
(5) මුදියන්සේ දිසානායක, ඇස්. පණිභාරත සහ ආරියරත්න කළුආරච්චි ය. (………)

**25.** A



B



C



ඉහත A, B සහ C රූපවලින් දක්වා ඇත්තේ පිළිවෙළින්,
(1) පහන් පැළ, ගොප් ගෙඩිය සහ සූනියම් වීදිය වේ.
(2) පහන් පැළ, ගොප් ගෙඩිය සහ කිරිමැස්ස වේ.
(3) පහන් පැළ, ගොප් ගෙඩිය සහ යහන වේ.
(4) ගොටුව, ගොප් ගෙඩිය සහ තොරණ වේ.
(5) ගොටුව, ගොප් ගෙඩිය සහ යහන වේ. (………)

- අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා **හිස්තැන් පුරවන්න**.

**26.** සංඛපාල රජු හා සම්බන්ධ කතා පුවත අයත් වන්නේ……………………………………… ශාන්තිකර්මයට ය.

**27.** නාට්‍ය ශාස්ත්‍රයේ දැක්වෙන පරිදි රස නිෂ්පත්තිය සඳහා විභාව, අනුභාව සහ ……………………………………… භාව සංයෝග වන බව කියැවේ.

**28.** රුසියාවේ ……………………………… රඟහල, බැලේ රංග කලාව සඳහා වඩාත් ප්‍රසිද්ධියට පත් වූවකි.

**29.** සලුපාළිය සහ ගිරිදේවි යන නර්තන අංග නූතන වේදිකාවට හඳුන්වා දෙන ලද්දේ ………………………… නම් පහතරට නර්තන ශිල්පියා විසිනි.

**30.** හඬ සුසර කර ගැනීම සඳහා **සවරම** යොදා ගනු ලබන්නේ ………………………… නම් වාද්‍ය භාණ්ඩයට ය.

**31.** තිශ්‍ර ජාති සහ මිශ්‍ර ජාති යන තාල ලක්ෂණ ……………………………… තාල පද්ධතියට අයත් වේ.

**32.** තල තුනක්, කෝණ හතරක් සහ දිසා ……………………… ක් නර්තන අවකාශ භාවිතයේ දී නියෝජනය වේ.

**33.** චුක්කිනියා සහ ඩුංගුරුවා යන චරිත දක්නට ලැබෙන්නේ ………………………… ජන නාටකයේ දී ය.

**34.** මහනුවර යුගයේ දී වන්නම් සහ ප්‍රශස්ති ගායනා වශයෙන් ඉදිරිපත් වූයේ දළදා මාළිගා භූමියේ පිහිටි ……………………………………………… දී ය.

**35.** කලුතාරම් සහ කුප්පායම් යන ආභරණ පළඳිනු ලබන්නේ භාරතීය ……………………………… නර්තනය සඳහා ය.

- අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර **තිත් ඉර** මත ලියන්න.

**36.** 'කලු යකා' සහ 'දරු නැලවිල්ල' යන නාට්‍යමය පෙළපාළි අයත් වන ශාන්තිකර්ම දෙක නම් කරන්න.

(i) කලු යකා: ……………………………………………………………

(ii) දරු නැලවිල්ල :……………………………………………………

**37.** 'මඩුපුරය' සහ 'හත් අඩිය' ඇතුළත් ශාන්තිකර්ම දෙක නම් කරන්න.

(i) මඩුපුරය : ……………………………………………………………

(ii) හත් අඩිය :……………………………………………………………

**38.** 'හංගි අවච්බා' සහ 'ශ්ලෝකම්' යන නර්තන අංග අයත් වන නර්තන සම්ප්‍රදායන් දෙක ලියන්න.

(i) හංගි අවච්බා: ……………………………………………………………

(ii) ශ්ලෝකම් :……………………………………………………………

**39.** **හංස විල** යන බැලේ නිර්මාණයෙහි නර්තන රචකයා සහ සංගීත නිර්මාණ ශිල්පියා නම් කරන්න.

(i) නර්තන රචකයා: ……………………………………………………

(ii) සංගීත නිර්මාණ ශිල්පියා :……………………………………………

**40.** පහත නම් සඳහන් ප්‍රවීණ නර්තන ශිල්පිනිය හා ශිල්පියා ප්‍රසිද්ධියට පත් වූයේ කවර නර්තන සම්ප්‍රදායන් සඳහා ද?

(i) බාල සරස්වති: ……………………………………………………………

(ii) බිර්ජු රාජ් :……………………………………………………………

**41.** පහත **A** හා **B** රූපවලින් දැක්වෙන සන්නියකුම ශාන්තිකර්මයේ නිරූපිත චරිත නම් කරන්න.

A



B



(i) **A** රූපය: ……………………………………………………………

(ii) **B** රූපය :……………………………………………………………

**42.** "බුද්ධං සරණං සිරස දරා ගෙන ...." යන කවි පදය මාත්‍රා තුනේ තාල රූපය අනුව ගැයීමේ දී ඊට අයත් සඳැස් මත් සහ ගී මත් ගණන සඳහන් කරන්න.

(i) සඳැස් මත් : ……………………………………………………………

(ii) ගී මත් :……………………………………………………………

**43.** 'භරත' සහ 'කථකලි' නර්තන සම්ප්‍රදායන්හි ගුරුවරුන් හඳුන්වන විශේෂිත නාම දෙක ලියන්න.

(i) භරත : ……………………………………………………………

(ii) කථකලි : ……………………………………………………………

**44.** 'සිංහල ගැමි නාටකය' සහ 'සිංහල සැරසිලි කලාව' යන කෘති රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

(i) සිංහල ගැමි නාටකය: ……………………………………………

(ii) සිංහල සැරසිලි කලාව :……………………………………………

**45.** විල්සන් ඔලබොඩුව සහ රද්දැල්ලේ පොඩි මහත්තයා යන නර්තන ශිල්පීන් ප්‍රවීණත්වයක් දැක්වූයේ කුමන නර්තන සම්ප්‍රදායන් සඳහා ද?

(i) විල්සන් ඔලබොඩුව: ……………………………………………

(ii) රද්දැල්ලේ පොඩි මහත්තයා :……………………………………

- අංක **46** සිට **47** තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.

**A**



**B**



**C**



**D**



**46.** ඉහත **A** සහ **B** රූපවලින් දක්වා ඇති රංග වස්ත්‍රාභරණ නම් කරන්න.

(i) **A** රූපය :……………………………………………………

(ii) **B** රූපය :……………………………………………………

**47.** ඉහත **C** සහ **D** රූපවලින් නිරූපිත නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) **C** රූපය :……………………………………………………

(ii) **D** රූපය :……………………………………………………

**48.** "කන්ද මුදුන්නේ පොකුණක මවාලා
එ දිය කෙළින්නට බිසවක් මවාලා"

මෙම කවිය අයත් වන ශාන්තිකර්මය සහ පෙළපාලි අංගය ලියන්න.

(i) ශාන්තිකර්මය: ……………………………………………

(ii) පෙළපාලි අංගය :……………………………………………

**49.** ලක්දිව, බලියාගය බෞද්ධ මුහුණුවරකින් ස්ථාපිත කරලීමට පුරෝගාමී වූ හිමිවරුන් **දෙදෙනකු** සඳහන් කරන්න.

(i) ……………………………………………………………

(ii) ……………………………………………………………

**50.** සෞන්දර්ය අධ්‍යයන ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වූ වර්ෂය සහ එය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට ස්ථාපිත වූ වර්ෂය සඳහන් කරන්න.

(i) කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වූ වර්ෂය: ……………………

(ii) ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට ස්ථාපිත වූ වර්ෂය :……………………

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

## අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2019

## පැරණි නිර්දේශය/ பழைய பாடத்திட்டம்

| විෂය අංකය பாட இலக்கம் | 52 | විෂයය பாடம் | නර්තනය (දේශීය) |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 2 | 21. | 2 |
| 02. | 1 | 12. | 4 | 22. | 1 |
| 03. | 5 | 13. | 3 | 23. | 4 |
| 04. | 2 | 14. | 5 | 24. | 4 |
| 05. | 3 | 15. | 2 | 25. | 3 |
| 06. | 3 | 16. | 1 | | |
| 07. | 1 | 17. | 2 | | |
| 08. | 1 | 18. | 4 | | |
| 09. | 4 | 19. | 4 | | |
| 10. | 1 | 20. | 5 | | |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 25 = 50

## I පත්‍රය

අංක 26 සිට 50 දක්වා

26. දහඅට සන්නිය / සන්නි යකුම
27. ව්‍යභිචාරී
28. බෝල්ෂෝයි
29. කේ.ඇස්. ප්‍රනාන්දු
30. උඩැක්කිය
31. කර්ණාටක
32. 06
33. කෝලම්
34. කවිකාර මඩුවේ
35. කථකලි

| | | |
|---|---|---|
| 36. | i. 18 සන්නිය / සන්නි යකුම | ii. රටයකුම / රිද්දියාගය |
| 37. | i. කොහොඹා කංකාරිය | ii. සූනියම් යාගය |
| 38. | i. මනිපුරි | ii. භරත |
| 39. | i. මාරියස් පෙටීපා | ii. පීටර් චෙයිකොව්ස්කි |
| 40. | i. භරත | ii. කථක් |
| 41. | i. A - අභිමාන යකා / අභිමානා | ii. B - සූනියම් යක්ෂණිය |
| 42. | i. සඳැස්මත් - 16 | ii. ගීමත් - 24 |
| 43. | i. නටුවනාහර් / නටුවනාර් | ii. ආසන් |
| 44. | i. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා | ii. ලයනල් බෙන්තරගේ මහතා |
| 45. | i. පහතරට | ii. සබරගමු |
| 46. | i. A - කෙයිමෙත්ත | ii. B - කාඟුල / කාඟුල් තොප්පිය |
| 47. | i. C - භරත | ii. D - බැලේ |
| 48. | i. රටයකුම / රිද්දියාගය | ii. නානුමුරය / දොළහ පෙළපාලිය |
| 49. | i. වීදාගම මෛත්‍රී හිමි | ii. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි |
| 50. | i. 1974 | ii. 2005 |

*ප්‍රශ්න අංක 01 - 25 දක්වා* **(02 x 25)** *ලකුණු 50*

*ප්‍රශ්න අංක 26 - 50 දක්වා* **(02 x 25)** *ලකුණු 50*

*මුළු ලකුණු 100*

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

2019.08.08 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* I වන කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II, III, IV කොටස්වලින් **එක්** ප්‍රශ්නය බැගින් ද තෝරා ගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයක ම (i) කොටසට ලකුණු 06 ක් ද (ii) කොටසට ලකුණු 06 ක් ද (iii) කොටසට ලකුණු 08 ක් ද වශයෙන් මුළු ලකුණු 20 ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

(අ) රුද ගත ගත ගත කුකුදත් ගජිංත ගත් ජිත් කුංදත්

(ආ) රෙගත් තම් ගත ගත්තම් ගුද ගත්තම් ගත ගත් දොම්

(ඇ) ජිංත කුකුද ගතිත කුකුද ජිංත කුකුද තා තකට

(ii) පහත සඳහන් කවි පද මාත්‍රා හතරේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

"සිරිවස ගෙන අසු නැගෙමින් නොලෙසා
සිරිබර ඉඹුලේ තුරු රැස නිවෙසා"

(iii) උඩරට කිරළා වන්නමේ අඩව්ව හෝ පහතරට නළු ගීතිකා තාලයේ ඉරට්ටිය හෝ මණ්ඩුක වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

**2.** සිංහල ශාන්තිකර්ම පද්ධතිය වූ කලී සමාජ සාරධර්ම හා ආකල්ප මත බැඳී පවතින්නකි.

(i) දෙවොල් මඩුව හෝ පහන් මඩුව ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතා මගින් හෙළිවන සමාජ සාරධර්ම පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ii) අයහපත් ක්‍රියාකලාපවල ඵල විපාක සමාජයට බලපාන ආකාරය සන්නියකුම ඇසුරෙන් සනාථ කරන්න.

(iii) තත් කාලීන සමාජ සම්බන්ධතා ගොඩනැගී ඇති ආකාරය කොහොඹා යක් කංකාරියේ චාරිත්‍ර විධි ඇසුරෙන් ඇගයීමට ලක්කරන්න.

**3.** රංග වස්ත්‍රාභරණ, සැරසිලි හා අලංකරණවලට සෑම ශාන්තිකර්මයක දී ම විශේෂත්වයක් හිමි වේ.

(i) වෙස් ඇඳුම් කට්ටලය හෝ තෙල්මේ ඇඳුම් කට්ටලය හෝ සබරගමු ප්‍රධාන ඇඳුම් කට්ටලය අතුරෙන් එකක් තෝරාගෙන එහි කොටස්වල පවතින විශේෂතා විග්‍රහ කරන්න.

(ii) සන්නියකුමේ ආහාර්ය අභිනයෙහි විශේෂතා සන්නි **දෙකක්** ඇසුරෙන් විචාරයට ලක්කරන්න.

(iii) "බලි ශාන්තිකර්මයේ සැරලිසි ක්‍රම අනෙක් ශාන්තිකර්මවලට වඩා වෙනස් මුහුණුවරක් ගනී." විමසන්න.

## II කොටස

**4.** දේශීය නර්තන කලාව විකාශනය වීමේ දී ඓතිහාසික තොරතුරු මෙන් ම විවිධ වූ සංස්කෘතික ලක්ෂණ ද බල පෑ බව මූලාශ්‍රය මගින් හෙළි වේ.

(i) පොළොන්නරු යුගයේ නර්තන කලාව සඳහා භාරතීය ආභාසය ලැබූ බවට සාධක **දෙකක්** ඉදිරිපත් කොට ඊට බලපෑ කරුණු විස්තර කරන්න.

(ii) කෝට්ටේ යුගයේ නර්තන කලාව ව්‍යාප්තව පැවති බවට සංදේශ කාව්‍ය **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iii) 1970 දශකයේ දී නර්තන කලාවේ සිදු වූ ප්‍රවණතා **හතරක්** තෝරාගෙන විෂයය ප්‍රවර්ධනය සඳහා ඒවායෙහි බලපෑම සාකච්ඡා කරන්න.

**5.** (i) "සොකරි, කෝලම් නාටකවල එකිනෙකට වෙනස් වූ අනන්‍යතා ලක්ෂණ ගොඩනැගී තිබේ." චරිත **දෙකක්** ඇසුරෙන් නාටක දෙකෙහි වෙනස්කම් පැහැදිලි කරන්න.

(ii) "ගැමි නැටුම් හා එම ගායනා මගින් හෙළිවන්නේ ඔවුන්ගේ අව්‍යාජත්වයයි." ගැමි නැටුම් **දෙකක්** නිදසුන් ලෙස ගෙන ඉහත පාඨය සනාථ කරන්න.

(iii) ප්‍රධාන වාද්‍ය භාණ්ඩ **දෙකක්** තෝරා ගෙන ඒවා සන්නිවේදන කාර්යයට යොදා ගන්නා ආකාරය හා එහි විශේෂතා ඇගයීමට ලක්කරන්න.

## III කොටස

**6.** පහත සඳහන් වගුවෙහි **(අ)**, **(ආ)** සහ **(ඉ)** යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) | (ආ) | (ඉ) |
|---|---|---|
| වර්ණම් | නාහර් සිං කුමාර් | ඇස්. පණිභාරත |
| රාස්ලීලා | මහා පීටර් | ඒ. ඉඹුල්ගොඩ |
| පරන් | උදය ශංකර් | චිත්‍රසේන ඩයස් |
| තෝඩායම් | ජිනදාස වික්‍රමසිංහ | ප්‍රේමකුමාර එපිටවෙල |

(i) **(අ)** කොටසෙහි සඳහන් **කථක්** නර්තනාංගය පිළිබඳ විස්තර කරන්න.

(ii) **(ආ)** කොටසෙහි සඳහන් **භාරතීය නෘත්‍ය නාටක ශිල්පියා** නම් කර ඔහුගේ නිර්මාණ පිළිබඳ සාකච්ඡා කරන්න.

(iii) **(ඉ)** කොටසේ සඳහන් නම් අතරෙන් සැලළිහිණිය මුද්‍රා නාට්‍යයේ නිර්මාණ ශිල්පියා තෝරාගෙන ඔහුගෙන් දේශීය මුද්‍රා නාට්‍ය කලාවට සිදු වූ සේවය ඇගයීමට ලක්කරන්න.

**7.** (i) "නල දමයන්ති මුද්‍රා නාට්‍යය සඳහා දේශීය හා විදේශීය මුද්‍රා නාට්‍යවල ආභාසය ලැබී ඇත." විමසන්න.

(ii) බටහිර බැලේ සංකල්පයේ ප්‍රභවය හා විකාශනය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) රසභාව සංකල්පය නානුමුරය හෝ සන්නි ඇසුරෙන් විමසුමට ලක්කරන්න.

## IV කොටස

**8.** අද්‍යතන ප්‍රාසංගික නර්තන නිර්මාණයේ දී ආනුෂංගික කලා භාවිතය වැඩි වශයෙන් දැකිය හැකි ය.

(i) රංගාලෝකය සඳහා භාවිත කෙරෙන විදුලි පහන් වර්ග **තුනක්** විස්තර කරන්න.

(ii) නූතන රංගවස්ත්‍රාභරණවල විවිධතා හා ප්‍රවණතා සාකච්ඡා කරන්න.

(iii) රංග භූමි අලංකරණයේ දී භාවිත ශිල්ප ක්‍රම ඇගයීමට ලක්කරන්න.

**9.** අද්‍යතන රුචිකත්වය මත නූතන සමාජ නර්තන කලාවක් බිහි වී තිබේ.

(i) ගීත නර්තන කලාවේ ජනප්‍රියත්වය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

(ii) "රියැලිටි (Reality) නර්තන තරගවලින් පාසල් දරුවන්ට අත්වැලක් ලබාදේ ද?" විමසන්න.

(iii) අද්‍යතනයේ නර්තනය හා සංගීතය යොදා ගන්නා සමාජ අවස්ථා දෙකක් තෝරාගෙන ඊට ප්‍රේක්ෂක රුචිකත්වය බලපා ඇති ආකාරය විචාරය කරන්න.

## I කොටස

01.

(i) **ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.**

**(අ) රුඳ ගත ගත ගත කුකුඳත් ගජිංත ගත් ජිත් කුංදත්**

| / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රුඳ | ගත | ගත | ගත | කුකු | ඳත් | ගජිං | -ත | ගත් | ජිත් | කුං | දත් |

**(ආ) රෙගත් තම් ගත ගත්තම් ගුඳ ගත්තම් ගත ගත් දොම්**

| / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රෙ | ගත් | - | තම් | - | ග | ත | ගත් | - | තම් | - | ගු |
| ඳ | ගත් | - | තම් | - | ග | ත | ගත් | - | දොම් | | |

**(ඇ) ජිංත කුකුඳ ගතිත කුකුඳ ජිංත කුකුඳ තා තකට**

| / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජිං | - | ත | කු | කු | ඳ | ග | ති | ත | කු | කු | ඳ |
| ජිං | - | ත | කු | කු | ඳ | තා | - | - | ත | ක | ට |

*විභාගවලට වෙන් කිරීම හා සංකේත නිවැරදිව භාවිත කර ඇත්නම් ලකුණු 02*

*පදය නිවැරදිව ප්‍රස්තාර කර තිබේ නම් ලකුණු 06*

*මුළු ලකුණු 08*

(ii) **පහත සඳහන් කවි පද මාත්‍රා හතරේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.**

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | සිරි | ව | ස | ගෙ | න | අ | සු | නැ | ගෙ | මින් | - | නො | ලෙ | සා | - |
| + | සිරි | බ | ර | ඉ | ඹු | ලේ | - | තු | රු | රැ | ස | නි | වෙ | සා | - |

හෝ

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සි | රි | ව | ස | ගෙ | න | අ | සු | නැ | ගෙ | මින් | - | නො | ලෙ | සා | - |
| සි | රි | බ | ර | ඉ | ඹු | ලේ | - | තු | රු | රැ | ස | නි | වෙ | සා | - |

*විභාගවලට වෙන්කිරීම හා සංකේත නිවැරදිව භාවිතකර තිබේ නම් ලකුණු 02*

*කවි පද නිවැරදිව ප්‍රස්තාර කර තිබේ නම් ලකුණු 06*

*මුළු ලකුණු 08*

(iii) **උඩරට කිරළා වන්නමේ අඩව්ව හෝ පහතරට නළුගීතිකා තාලයේ ඉරට්ටිය හෝ මණ්ඩුක වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.**

උඩරට කිරළා වන්නමේ අඩව්ව

| ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තත් | - | ත | ත | රි | ත | රි | ත | ත | රි | ත | රි | ත | රි |
| රු | ඳ | ග | ජි | මි | ජි | මි | ති | තිත් | - | තෙයි | - | - | - |
| ත | තත් | - | ජිත් | - | ජිත් | - | තො | තොං | - | නං | - | නං | - |
| රු | ඳ | ග | ජි | මි | ජි | මි | ති | තිත් | - | තෙයි | | | |

පහතරට නළුගීතිකා තාලයේ ඉරට්ටිය

| ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තත් | දි | ත | ග | ති | ග | ත | තරි | කි | ට | කි | ටි | ත | ක |
| තත් | දිත් | - | කි | ටි | ත | ක | තරි | කි | ට | කි | ටි | ත | ක |
| තත් | ජෙං | - | ත | ක | ජෙං | - | කි | ටි | තක | දි | කු | ඳ | ක |
| දැහිං | | | | | | | | | | | | | |

ඉහත ඉරට්ටිය විභාග අටකට වෙන්කර ප්‍රස්ථාර කර තිබුණා ද නිවැරදිය.

<u>මණ්ඩූක වන්නමේ අඩව්ව</u>

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ජිං | - | ත | ගත් | - | තත් | - | ග | ති | ත | ග | ත | දොං | - |
| ජිං | - | ත | ග | ත | ග | ත | ග | ති | ත | ග | ත | දොං | - |
| ජිං | - | ත | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| තා | - | - | ගත් | - | තත් | - | ග | තත් | - | කු | ඳ | ග | ත |
| තා | | | | | | | | | | | | | |

*නිවැරදි විභාගවලට වෙන්කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*

*පද නිවැරදිව ප්‍රස්තාර කර තිබේනම් ලකුණු 06*

*මුළු ලකුණු 08*

02. **සිංහල ශාන්තිකර්ම පද්ධතිය වූ කලි සමාජ සාරධර්ම හා ආකල්ප මත බැඳී පවතින්නකි.**

(i) **දෙවොල් මඩුව හෝ පහන් මඩුව ශාන්තිකර්මයේ පුරාවෘත්ත කතා මගින් හෙළිවන සමාජ සාරධර්ම පිළිබඳ හැඳින්වීමක් කරන්න.**

- වෛරය, ක්‍රෝධය, පළිගැනීම හා ප්‍රාණඝාතය යනාදී අයහපත් ක්‍රියාවන් සමාජයේ යහපැවැත්මට අනිසි ලෙස බලපාන බව.
- ක්ෂණික කෝපය හේතුවෙන් සිදුකරන වැරදි ක්‍රියාවලින් ලබන විපාකය පුද්ගලයාට බලපාන ආකාරය මගින් සමාජයට පණිවිඩයක් ලබාදෙන බව.

*ඉහත කරුණු ඇසුරෙන් හැඳින්වීමක් කර ඇත්නම් ලකුණු 06*

(ii) **අයහපත් ක්‍රියාකලාපවල ඵල විපාක සමාජයට බලපාන ආකාරය සන්නියකුම ඇසුරෙන් සනාථ කරන්න.**

- සන්නි යකුමේ <u>සංඛපාල කතාව</u> හා <u>දංඋදියාගේ කථාව</u> ඇසුරෙන් උදාහරණ ගෙන සනාථ කළ හැකි බව.
- සංඛපාල කතාවේ අයහපත් ක්‍රියාවන් ලෙස බොරු කීම, කේලම් කීම, කේලම් ඇසීම, ඊර්ෂියාව, වෛරය, පළිගැනීම වැනි සිතුවිලි සමාජ විනාශයට බලපාන ආකාරය පැහැදිලි කර ඇති බව.
- සමාජය මුලා කිරීම, රැවටීම, බොරුකීම වැනි පාප ක්‍රියාවන්හි නිරතවීමෙන් පල විපාක ලැබෙන බව දංඋදියාගේ කතාව ඇසුරින් පැහැදිලි කර ඇති බව.

*ඉහත කරුණු ඇසුරෙන් සනාථ කර ඇත්නම් ලකුණු 06*

(iii) **තත් කාලීන සමාජ සම්බන්ධතා ගොඩනැගී ඇති ආකාරය කොහොඹා යක් කංකාරියේ චාරිත්‍ර විධි ඇසුරෙන් ඇගයීමට ලක්කරන්න.**

- <u>පූර්ව චාරිත්‍ර විධි හා ශාන්තිකර්ම දින චාරිත්‍ර විධි ඇසුරෙන්</u>

  ආරාධනය, කරල් හා අක්යාල වෙන් කිරීම, කප් සිටුවීම, මඩුපේ කිරීම, තොටපේ කිරීම, පොල් බුලතේ යාම ......... ආදි

- <u>සමාජ සම්බන්ධතා ගොඩනැගී ඇති ආකාරය පහත සඳහන් කරුණු ඔස්සේ ඇගයීමට ලක්කර තිබේනම්,</u>

  - සහයෝගය
  - සමානාත්මතාව
  - එකමුතුකම
  - කැපවීම
  - අන්‍යෝන්‍ය සුහදතාව

*චාරිත්‍ර විධි හතරක් නම් කිරීමට ලකුණු 04*
*ඇගයීමට ලක්කර ඇත්නම් ලකුණු 04*
*මුළු ලකුණු 08*

03. **රංග වස්ත්‍රාභරණ, සැරසිලි හා අලංකරණවලට සෑම ශාන්තිකර්මයක දී ම විශේෂත්වයක් හිමි වේ.**

(i) **වෙස් ඇඳුම් කට්ටලය හෝ තෙල්මේ ඇඳුම් කට්ටලය හෝ සබරගමු ප්‍රධාන ඇඳුම් කට්ටලය අතුරින් එකක් තෝරාගෙන එහි කොටස්වල පවතින විශේෂතා විග්‍රහ කරන්න.**

- එක් ඇඳුම් කට්ටලයකට අයත් කොටස් හා එම කොටස්වල විශේෂතා විග්‍රහකර ඇති බව.
- ආභරණවලට හා රංගවස්ත්‍රවලට යොදා ගෙන ඇති අමුද්‍රව්‍ය, හැඩතල සහ වර්ණ භාවිතයේ විශේෂතා විග්‍රහ කර ඇති බව.
- ඉහත කරුණු සැළකිල්ලට ගෙන ඒවායේ විශේෂ අන්‍යන්‍යතා ලක්‍ෂණ පෙන්වා තිබීම.

*තෝරාගත් ඇඳුම් කට්ටලයේ කොටස් නම් කර එහි විශේෂතා කරුණු 3 ක් යටතේ විග්‍රහ කර ඇත්නම් ලකුණු 06*

(ii) **සන්නියකුමේ ආහාර්ය අභිනයෙහි විශේෂතා සන්නි <u>දෙකක්</u> ඇසුරෙන් විචාරයට ලක්කරන්න.**

- වෙස්මුහුණුවල හැඩයෙහි ඇති විවිධත්වය හා වර්ණ සංයෝජනයෙහි ඇති වෙනස්කම් හඳුනාගෙන ඇති බව.
- පරිසරයෙන් ලබාගත් අමුද්‍රව්‍ය ඇසුරෙන් රංගවස්ත්‍ර, රංගභාණ්ඩ, ආලේපන සකස් කරගැනීම හා භාවිත විධික්‍රම ඇති බව.
- සන්නි රඟමඩලේ සැරසිලි සඳහා බුරුල්ල අතු, කෙසෙල් පතුරු වැනි අමුද්‍රව්‍ය යොදා ගැනීම හා සන්නි චරිත රඟ දැක්වීමේ දී සන්නි වීදිය, පසුතලයක් සේ උපයෝගී කරගන්නා බව.
- කටකෑලි, දත්ඇදි ....... ආදිය භාවිත කර ඇති බව.

*සන්නි දෙක තෝරාගැනීමට ලකුණු 02*
*ඉහත කරුණු ඇසුරෙන් විචාරයට ලක්කර ඇත්නම් ලකුණු 04*
*මුළු ලකුණු 06*

(iii) **"බලි ශාන්තිකර්මයේ සැරසිලි ක්‍රම අනෙක් ශාන්තිකර්මවලට වඩා වෙනස් මුහුණුවරක් ගනී." විමසන්න.**

- බලි ඇඹීම, කඩබලි ඇඳීමේ වෙනස්කම් හඳුනාගෙන ඇති බව.
- ස්වභාවික අමුද්‍රව්‍ය යොදාගනිමින් වර්ණ සැකසීම හා වර්ණ ගන්වා ඇතිබව.
- මල් බුලත් පුටුවක් සකසා ගන්නා බව.
- නව ග්‍රහයින් සඳහා නියමිත වෘක්ෂවල කොළ වර්ගවලින් බලි මඩුවේ උඩු වියන අලංකාරව සකස් කරගන්නා බව.

*වෙනස්කම් පිළිබඳ උදාහරණයට ගනිමින් විමසා ඇත්නම් ලකුණු 08*

**II කොටස**

04. **දේශීය නර්තන කලාව විකාශනය වීමේ දී ඓතිහාසික තොරතුරු මෙන් ම විවිධ වූ සංස්කෘතික ලක්ෂණ ද බලපෑ බව මූලාශ්‍රය මගින් හෙළි වේ.**

(i) **පොළොන්නරු යුගයේ නර්තන කලාව සඳහා භාරතීය ආභාසය ලැබූ බවට සාධක <u>දෙකක්</u> ඉදිරිපත් කොට ඊට බලපෑ කරුණු විස්තර කරන්න.**

- අංක 2 දරණ ශිව දේවාලයෙන් සොයා ගනු ලැබූ ලෝකඩ නටරාජා ප්‍රතිමාව.
- පාලමොට්ටයි ශිලා ලිපියෙහි සඳහන් දේවදාසි නර්තනය.
- දැදිගම සුතිඝර චෛත්‍යය හෙවත් කොටවෙහෙරෙන් සොයාගනු ලැබූ ඇත් පහන.
- සැටදාගෙයි ඇතුළුවන දොරටුවෙහි බිත්ති දෙපස රූකම්.

*සාධක දෙකට ලකුණු 02*

*භාරතීය ආභාසය ලැබූ බව විස්තර කිරීමට ලකුණු 04*

*මුළු ලකුණු 06*

(ii) **කෝට්ටේ යුගයේ නර්තන කලාව ව්‍යාප්තව පැවති බවට සංදේශ කාව්‍ය දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න.**

- පරෙවි සංදේශය
  - ලෙළවන දිගුනෙත නිලුපුල සේයා
  - ලෙළදුන් නව තඹ පළුවන් පාදේ
- කෝකිල සංදේශය
  - අඳිමින් සුදු පටසළු ගෙල සඳුනින් තුනු තවරා
- සැවුල් සංදේශය
  - බරත සතර පෙර ඉසිවර කී ලෙසට
- සැලලිහිණි සංදේශය
  - විදෙන ලෙළෙන නරු බර පුළුලුකුල රැඳී
  - ලකල පුළුලුකුල බැඳි මිණි මෙවුල්ලා

*සංදේශ කාව්‍ය දෙකක් ඇසුරෙන් පැහැදිලි කර ඇත්නම් ලකුණු 06*

(iii) **1970 දශකයේ දී නර්තන කලාවේ සිදු වූ ප්‍රවණතා <u>හතරක්</u> තෝරාගෙන විෂයය ප්‍රවර්ධනය සඳහා ඒවායෙහි බලපෑම සාකච්ඡා කරන්න.**

- <u>ප්‍රවණතා</u>
    - 1972 වර්ෂයේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සෞන්දර්ය විෂය අනිවාර්ය විෂයක් බවට පත්කිරීම.
    - 1972 වර්ෂයේ ගිරාගම ගුරු විදුහල ආරම්භ කිරීම.
    - 1975 වර්ෂයේ ජා.පො.අ.ස. විභාගය සඳහා නර්තන විෂය ඇතුළත් කිරීම.
    - 1974 වර්ෂයේ රජයේ නැටුම් හා මුද්‍රානාට්‍ය විද්‍යාලය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යාපන ආයතනය බවට පත්කිරීම.
    - 1978 වර්ෂයේ විශ්වවිද්‍යාල පනත යටතේ 1979 ජනවාරි 01 දින කැළණිය විශ්වවිද්‍යාලයේ, සෞන්දර්ය අධ්‍යයන ආයතනය නමින් ප්‍රතිසංවිධානය වීම.
    - 1972 වර්ෂයේ දී යුධ හමුදා හා නාවික හමුදා නර්තන කණ්ඩායම් බිහිවීම.
    - 1973 වර්ෂයේ පොලිස් නර්තන කණ්ඩායම බිහිවීම.
    - 1978 ජාතික තරුණ සේවා සභා නර්තන කණ්ඩායම බිහිවීම.

***ප්‍රවණතා 4 ක් නම් කිරීමට ලකුණු 04***

***විෂය ප්‍රවර්ධනය සඳහා ඒවායෙහි බලපෑම විස්තර කර ඇත්නම් ලකුණු 04***

***මුළු ලකුණු 08***

05.

(i) **"සොකරි, කෝලම් නාටකවල එකිනෙකට වෙනස් වූ අනන්‍යතා ලක්ෂණ ගොඩනැගී තිබේ.'' චරිත දෙකක් ඇසුරෙන් නාටක දෙකෙහි වෙනස්කම් පැහැදිලි කරන්න.**

<u>සොකරි</u>

- සොකරි නාටකයේ චරිතයක් නම්කර තිබීම.
- චරිතය සඳහා සරල බෙරපද සහ චලන යොදා ගැනීම.
- තාවකාලිකව සාදාගන්නා ලද වෙස්මුහුණු (කොළපත් / කාඩ්බෝඩ්) හා රංගවස්ත්‍රාභරණ යොදා ගැනීම.
- ගායනාවල ඇති සරල බව හා දෙබස් භාවිතය.
- පිරිමින් පමණක් සියළු චරිත රඟ දක්වන බව.

<u>කෝලම්</u>

- කෝලම් නාටකයේ චරිතයක් නම්කර තිබීම.
- පහතරට සාම්ප්‍රදායික නර්තන අංගවල එන ශාස්ත්‍රීය බෙර පද කෝලම් චරිත සඳහා යොදා ගැනීම.
- විවිධ නාදමාලා වලට අයත් ගායනා හා දෙබස් භාවිත කර ඇති බව.
- සංකීර්ණ චලන යොදාගෙන ඇති බව.
- සාම්ප්‍රදායික වෙස් මුහුණු චරිතයට ආවේණිකව භාවිත කර ඇති බව.

- සෑම චරිතයක්ම පිරිමින් විසින් රඟ දැක්වීම.
- කෝලම් චරිතය සඳහා අනන්‍ය වූ රංගවස්ත්‍රාභරණ භාවිත කර ඇති බව.

***චරිත දෙකක් නම්කර ඇත්නම් ලකුණු 02***

***වෙනස්කම් පැහැදිලි කර ඇත්නම් ලකුණු 04***

***මුළු ලකුණු 06***

(ii) **"ගැමිනැටුම් හා එම ගායනා මගින් හෙළිවන්නේ ඔවුන්ගේ අව්‍යාජත්වයයි.'' ගැමි නැටුම් දෙකක් නිදසුන් ලෙස ගෙන ඉහත පාඨය සනාථ කරන්න.**

- ගැමි නැටුම් දෙකක ගායනා මගින් ගැමියන්ගේ ජීවන රටාව දක්වා ඇති බව.
- ගැමි නැටුම් හා ගැමි ගායනාවලින් හෙළිවන
  - ආගමික සබඳතාව, හිරු සඳු වැනි ස්වභාවික වස්තූන් දේවත්වයෙන් පිදීම, සාමුහිකත්වය ....... ආදි කරුණු පිළිබඳ අවබෝධය ඇති බව.

***ගැමි නැටුම් 2 ක් නම්කර ඇත්නම් ලකුණු 02***
***ගැමියන්ගේ අව්‍යාජත්වය සනාථ කර ඇත්නම් ලකුණු 04***
***මුළුලකුණු 06***

(iii) **ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දෙකක් තෝරාගෙන ඒවා සන්නිවේදන කාර්යයට යොදාගන්නා ආකාරය හා එහි විශේෂතා ඇගයීමට ලක්කරන්න.**

- වාද්‍ය භාණ්ඩ දෙකක් තෝරාගැනීම.
- තෝරාගත් වාද්‍ය භාණ්ඩ සන්නිවේදන කාර්යයට යොදාගන්නා ආකාරය විස්තර කර තිබීම.
- සන්නිවේදන අවස්ථා

  (උදා - මළබෙර, අණබෙර, වඩබෙර, රණබෙර .... ආදි)

<u>විශේෂතා</u>

- සන්නිවේදන කාර්යයේ දී බෙරපදවල අන්‍යන්‍යතා ලක්‍ෂණ ඇති බව.

  උදා - සුදු පිරුවටයකින් ආවරණය කිරීම, රිද්මය, පද හා අක්‍ෂර වාදනයේ උස්පහත් බව ...

  ආගමික කටයුතුවලදී අවස්ථාව හා කාලය පිළිබඳ දැනුවත් කිරීම.

  (අළුයම්, මැදියම්, හැන්දෑ ධූර වාදනය, තේවා හේවිසි, පූජා හේවිසි, ගමන් හේවිසි නවපැය තේවාව, .... ආදි)

***වාද්‍ය භාණ්ඩ දෙකක් තෝරාගැනීමට ලකුණු 02***
***කරුණු 3 ක් ඔස්සේ විශේෂතා ඇගයීමට ලක්කර ඇත්නම් ලකුණු 06***
***මුළු ලකුණු 08***

## III කොටස

06. **පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) **(අ) කොටසෙහි සඳහන් කථක් නර්තනාංගය පිළිබඳ විස්තර කරන්න.**

පරන්

- කථක් නර්තන සම්ප්‍රදායේ ශාස්ත්‍රීය නර්තන අංගයක් බව.
- පරන් වර්ග කිහිපයක් ඇති බව.
  උදා - සාදා පරන්, චක්‍රධාර් පරන්, විජිලි පරන්
- පඛ්වාජ් වාද්‍ය භාණ්ඩයෙන් වයනු ලබන පද විශේෂයන් අනුව නර්තනය කරන බව.

*නර්තනාංගය තෝරාගැනීමට ලකුණු 02*
*විස්තර කර ඇත්නම් ලකුණු 04*
*මුළු ලකුණු 06*

(ii) **(ආ) කොටසෙහි සඳහන් භාරතීය නෘත්‍ය නාටක ශිල්පියා නම් කර ඔහුගේ නිර්මාණ පිළිබඳ සාකච්ඡා කරන්න.**

උදය ශංකර්

- රෝයල් කොලේජ් ඔෆ් ආට්ස් ආයතනයේ සම්මාන සහ ශිෂ්‍යත්ව ගණනාවක් දිනා ගනිමින් ස්වකීය ප්‍රථම නෘත්‍ය සංදර්ශනය ඉදිරිපත් කළ බව.
- ඇනා පැව්ලෝවා බැලේ ශිල්පිණිය සමඟ රාධා,ක්‍රිෂ්ණ, ශිව,පාර්වතී ආදී නෘත්‍ය නාටක නිර්මාණය සඳහා දායකත්වය දුන් බව.
- නෘත්‍ය සමාගමක් ආරම්භ කර පවත්වාගෙන ගිය බව.
- කල්පනා, ජීවන රිද්මය, ක්‍රිෂ්ණලීලා ..... ආදී නිර්මාණ කර ඇති බව.

*ශිල්පියා නම් කිරීමට ලකුණු 02*
*දායකත්වය පිළිබඳ සාකච්ඡා කර ඇත්නම් ලකුණු 04*
*මුළු ලකුණු 06*

(iii) **(ඉ) කොටසෙහි සඳහන් නම් අතරෙන් සැලළිහිණිය මුද්‍රා නාට්‍යයේ නිර්මාණ ශිල්පියා තෝරාගෙන ඔහුගෙන් දේශීය මුද්‍රා නාට්‍ය කලාවට සිදු වූ සේවය ඇගයීමට ලක්කරන්න.**

ප්‍රේමකුමාර එපිටවෙල

- 1950 වසරේ දී සැළලිහිණිය නම් ඉගිනළුව නිෂ්පාදනය කළ බව.
- ශාකුන්තල, තිත්ත බත, දියසේන, සාරභූමි, නවයුගය, පරෙවිය ආදී නිර්මාණ කළ බව.
- 1993 දී ප්‍රථම පාරිසරික ඉගිනළුව ලෙස "රන්දිය" නිර්මාණය කර ඇති බව.
- රජය මගින් පිරිනමන ලද ශිෂ්‍යත්වයක් ලැබ භාරතයේ වැඩිදුර අධ්‍යාපනය ලබා ඇති බව.

*නිර්මාණ ශිල්පියා තෝරාගැනීමට ලකුණු 02*
*ඇගයීමට ලක්කර ඇත්නම් ලකුණු 06*
*මුළු ලකුණු 08*

07.

(i) **"නල දමයන්ති මුද්‍රා නාට්‍ය සඳහා දේශීය හා විදේශීය මුද්‍රා නාට්‍යවල ආභාසය ලැබී ඇත. විමසන්න.**

- භාරතීය කථා පුවතක් යොදා ගෙන ඇති බව.
- චරිත නිරූපණයට සුදුසු පද හා චලන භාවිත කිරීමේ දී භාරතීය නර්තන ආභාසය ලබා ඇති බව.
- අවස්ථා නිරූපණය සඳහා දේශීය නර්තන සම්ප්‍රදායන්වල ආභාසය ලබා ඇති බව.
- භාරතීය හා බටහිර සංගීතය අවස්ථා නිරූපණය සඳහා යොදා ඇති බව.
- බැලේ නාට්‍යවල චලන ඇසුරෙන් රංග රචනය කර ඇති බව. (පැනීම්, කැරකීම්, ඇවිදීම ආදිය)
- දේශීය හා විදේශීය මුද්‍රා නාට්‍යවල චරිත සහ අවස්ථා තීව්‍රකර දැක්වීම සඳහා රංග වස්ත්‍රාභරණ, පසුතල නිර්මාණ, සංගීතය, විදුලි ආලෝකය භාවිත කර ඇති බව.

***ඉහත කරුණු ඇසුරින් දේශීය හා විදේශීය ආභාසය විමසා ඇත්නම් ලකුණු 06***

(ii) **බටහිර බැලේ සංකල්පයේ ප්‍රභවය හා විකාශනය පිළිබඳ විග්‍රහයක් කරන්න.**

- 15 හා 16 වන සියවස්වල ඉතාලියේ රාජකීය ප්‍රියසම්භාෂණවලදී ප්‍රභවය හා කැතරින් බිසවගේ දායකත්වය ලබා ඇති බව.
- 14 වන ලුවී රජුගේ දායකත්වයෙන් 17 වන සියවසේ ප්‍රංශයේ දී ව්‍යාප්ත වූ බව.
- රුසියාව, ඇමෙරිකාව, ජර්මනිය, එංගලන්තය ආදී රටවල ව්‍යාප්ත වූ බව.
- VIII වන හෙන්රි රජු සහ I වන එලිසබෙත් රැජින සමයේ දී සාමාන්‍ය ජනයා අතර ප්‍රචලිත වූ බව.
- බැලේ සම්ප්‍රදාය විකාශනය වීමේදී හංසවිල, නිදිකුමරිය, නට්ක්‍රැකර් යන නිර්මාණයන් බිහිවීම.

***ඉහත කරුණු ඇසුරෙන් ප්‍රභවය හා විකාශනය පිළිබඳ විග්‍රහකර ඇත්නම් ලකුණු 06***

(iii) **රසභාව සංකල්පය නානුමුරය හෝ සන්නි ඇසුරෙන් විමසුමට ලක්කරන්න.**

<u>නානුමුරය</u>

- සංවාද, ගායන, වාදන, චලන, රංගවස්ත්‍ර, අංගරචනය, රංග භාණ්ඩ භාවිත කර ඇති බව.
- යකැදුරු රිද්දි බිසවගේ චරිතයට සමාරෝපය වන බව.
  උදා - නානුගෑම, හිස පීරීම, සළු පැලදීම ...... ආදී අවස්ථා

<u>සන්නි</u>

- සන්නි වෙස්මුහුණුවල විවිධත්වය.
- සන්නි චරිත නිරූපණයේ දී චරිතවලට යොදාගන්නා විවිධ වර්ණ, ඇස්, දළ, කෙස්වැටි, කෘතිම උදර භාවිතය.

***ඉහත කරුණු ඇසුරෙන් රසභාව සංකල්පය විමසුමට ලක්කර ඇත්නම් ලකුණු 08***

IV කොටස

08. **අද්‍යතන ප්‍රාසංගික නර්තන නිර්මාණයේදී ආනුෂංගික කලා භාවිතය වැඩි වශයෙන් දැකිය හැකිය.**

(i) **රංගාලෝකය සඳහා භාවිත කෙරෙන විදුලි පහන් වර්ග තුනක් විස්තර කරන්න.**

- තිත් පහන්, ධාරා පහන්, ප්‍රක්ෂේපණ ලාම්පු, පරිභ්‍රමණ ලාම්පු, රසදිය වාෂ්පී ලාම්පු, වර්ණරෝද, වර්ණ පෙරන

***විදුලි පහන් වර්ග තුනක් නම් කර ඇත්නම් ලකුණු 03***
***විස්තර කර ඇත්නම් ලකුණු 03***
***මුළු ලකුණු 06***

(ii) **නූතන රංග වස්ත්‍රාභරණවල විවිධතා හා ප්‍රවණතා සාකච්ඡා කරන්න.**

- රංග වස්ත්‍රාභරණ කොටස් හා අනුකොටස් වශයෙන් විවිධත්වයෙන් නිර්මාණය වන බව.
- කාන්තා පුරුෂ රංග වස්ත්‍රාභරණ නිර්මාණය කිරීම සඳහා පෙර අපර දෙදිග නර්තන සම්ප්‍රදාය වලින් ලබාගත් ආභාසයෙන් නව ප්‍රවණතා දැකිය හැකි බව.

***විවිධතා සඳහා ලකුණු 03***
***ප්‍රවණතා සඳහා ලකුණු 03***
***මුළු ලකුණු 06***

(iii) **රංගභූමි අලංකරණයේ දී භාවිත ශිල්ප ක්‍රම ඇගයීමට ලක්කරන්න.**

- පසුතල නිර්මාණය සඳහා අද්‍යතනයේ විවිධ ශිල්පක්‍රම භාවිත කර ඇති බව.
- නූතන තාක්ෂණික මෙවලම් භාවිත කර ඇති බව.
- රංගභූමිවල විවිධත්වය මතුකිරීම සඳහා විවිධ සැරසිලි භාවිත කරන බව.

***ශිල්ප ක්‍රම ඇගයීමට ලක්කර තිබේ නම් ලකුණු 08***

09. **අද්‍යතන රුචිකත්වය මත නූතන නර්තන සමාජ කලාවක් බිහි වී තිබේ.**

(i) **ගීත නර්තන කලාවේ ජනප්‍රියත්වය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.**

- වේග රිද්ම සංගීතයට අනුව නර්තන නිර්මාණය වී ඇති බව.
- ශෘංගාරාත්මක රසය ඉස්මතු වන පරිදි හුදු චලන භාවිත කරන බව.
- විචිත්‍රවත් ඇඳුම් පැළඳුම් භාවිත කරන බව.
- ශරීරාංග කොටස් ඉස්මතු වන පරිදි රංගවස්ත්‍ර නිර්මාණය කර ඇති බව.

***ඉහත කරුණු ඇසුරෙන් ගීත නර්තන කලාවේ ජනප්‍රියත්වය පිළිබඳ අදහස් දක්වා ඇත්නම් ලකුණු 06***

(ii) **"රියැලිටි (Reality) නර්තන තරඟවලින් පාසල් දරුවන්ට අත්වැලක් ලබාදේද?'' විමසන්න.**

- රූපවාහිනී රියැලිටි ප්‍රසංග නම්කර තිබීම.
- නර්තන නිර්මාණවල ඇති ප්‍රාසංගික බව.
- තරඟකාරිත්වයේ ස්වභාවය ඉස්මතු වන බව.

*රියැලිටි නර්තන වැඩසටහන් නම් කිරීමට ලකුණු 02*

*ඉහත තොරතුරු ඇසුරෙන් විමසා තිබීම ලකුණු 04*

*මුළු ලකුණු 06*

(iii) **අද්‍යතනයේ නර්තනය හා සංගීතය යොදාගන්නා සමාජ අවස්ථා දෙකක් තෝරාගෙන ඊට ප්‍රේක්ෂක රුචිකත්වය බලපා ඇති ආකාරය විචාරය කරන්න.**

- සමාජ අවස්ථා දෙකක් තෝරාගෙන තිබීම.
- නව තාක්ෂණය මුසුකර ගත් සංගීත ක්‍රමයන් භාවිත කර ඇති බව.
- ලෝකයේ විවිධ නර්තන ශෛලීන් හා ඊට අනුගත අනුශාංගික අංග භාවිත කර ඇති බව.
- නර්තනයේ ඇති චමත්කාරයට සංගීතයේ සුගම බව මුසුවීම නිසා ප්‍රේක්ෂක රුචිකත්වය වර්ධනය වන බව.

*සමාජ අවස්ථා දෙක තෝරාගෙන තිබීමට ලකුණු 02*

*ඉහත කරුණු විචාරයට ලක්කර ඇත්නම් ලකුණු 06*

*මුළු ලකුණු 08*